## ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. CSS/7/5/6/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2017.04. 20 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 06-2017**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>භාෂා පරිවර්තනය, භාෂණ පරිවර්තනය හා යතුරුලියනය කිරීම වෙනුවෙන් වූ ගාස්තු සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2003(IV) හා 2017.02.27 දිනැති ලිපිය හා බැඳේ. (එහි පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8/1 හා 2017.03.29 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.එම චක්‍රලේඛයේ සඳහන් පරිදි 2016.08.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2003(III) හි 03 (අ) 1හි හා (ආ) හි සඳහන් ගාස්තු ප්‍රමාණයන් පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

(අ) <u>පරිවර්තන ගාස්තු</u>

I. ලේඛන වර්ගය නොසලකා, පරිවර්තනය කරනු ලබන වචන ගණන අනුව එක් වචනයකට රු.2.50ක් බැගින් ගෙවිය යුතුය.

(ආ) <u>භාෂණ පරිවර්තන ගාස්තු</u>

භාෂණ පරිවර්තන ගාස්තු පැයකට නිශ්චිත දීමනාවක් ලෙස පළමු පැයට වන දීමනාව වැඩි වන සෑම පැයකදීම ලබා දිය යුතුය.

04.මෙම චක්‍රලේකයේ සඳහන් විධිවිධාන මෙම උපදෙස් ලිපිය නිකුත් කරන දින සිට ක්‍රියාත්මක වේ.

05. ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් භාෂා පරිවර්තනය, භාෂණ පරිවර්තනය හා යතුරුලියන කටයුතු කිරීමේදී ඉහත සඳහන් සංශෝධිත ගාස්තු අනුව ගෙවීම් කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2003(IV)

මගේ අංකය : EST-7/ALLOW/04/2000/3
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2017.02.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**භාෂා පරිවර්තනය, භාෂණ පරිවර්තනය හා යතුරුලියනය කිරීම වෙනුවෙන් වූ ගාස්තු සංශෝධනය කිරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2016.08.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003(III)හි 03 ඡේදයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඉහත සඳහන් චක්‍රලේඛයේ 03 (අ) 1හි හා (ආ)හි සඳහන් ගාස්තු ප්‍රමාණයන් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

(අ) පරිවර්තන ගාස්තු

I. ලේඛන වර්ගය නොසලකා, පරිවර්තනය කරනු ලබන වචන ගණන අනුව එක් වචනයකට රු.2.50ක් බැගින් ගෙවිය යුතුය.

(ආ) භාෂණ පරිවර්තන ගාස්තු

භාෂණ පරිවර්තන ගාස්තු පැයකට නිශ්චිත දීමනාවක් ලෙස පළමු පැයට වන දීමනාව වැඩි වන සෑම පැයකදීම ලබා දිය යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය